# ග්‍රාමීය ණය හා මෑතකාලීන වෙනස්කම්

(පසුගිය කලාපයෙන්)

විවිධ අධ්‍යයන සහ සමාජ ආර්ථික පර්යේෂණ මේ තත්ත්වය පිළිබඳව රජයට කරුණු පෙන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ අනුග්‍රහය යටතේ ගැමි ජනතාවට ණය පහසුකම් සැපයීම සඳහා බැංකු වලට උපදෙස් ලැබීමෙන් අනතුරුව විවිධ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම රාජ්‍ය බැංකු මාර්ගයෙන් දියත් කර ඇත.

ණය යෝජනා ක්‍රම දියත් කර ඇති නමුත්, ඊට ප්‍රවේශ වීමට අවශ්‍ය අවම සුදුසුකම් වලින් ගැමියා පරිපූර්ණ වී නොමැති වීම නිසා ඒවායින් රජය හෝ බැංකු බලාපොරොත්තු වන ඉලක්ක ගත අරමුණු ඉටු කර ගැනීම තරමක් ඈතින් ඈතට දුරස් වෙමින් පවතී.

එමෙන්ම පහසු ප්‍රවේශයන් ලබා දුන් ඇතැම් ණය යෝජනා ක්‍රම වල දී එම මුදල් ආපසු නොගෙවීමේ ප්‍රතිශතය වැඩිවී තිබීම බැංකුවට ගැටළුවක් වී තිබේ. එය ග්‍රාමීය ආර්ථික කටයුතු වල දී, බලාපොරොත්තු තබා සිටින ඉලක්ක ගත අරමුණු එම ආයෝජකයින්ට සාර්ථක ලෙස ලබා ගත නොහැකි වීමේ ආර්ථික අස්ථාවරත්වයේ "පිළිබිඹුවක්" වශයෙන් සැළකිය හැකි ය. ඇතැම් විට ඔවුන්ට කිහිප වතාවක් එවැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවුවහොත් ගැමි ජනතාවගේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම බිඳ වැටේ. ගැමි ආර්ථිකයේ "යථා ස්වරූපය" එයයි. ඉතාමත් අවදානමෙන් යුතු හා විවිධ ව්‍යසනයන්ගේ තාඩන පීඩන වලට ලක්වීමේ විභවතාවයෙන් යුතු එය, ආර්ථික, සමාජික, දේශපාලනික හා පෞද්ගලික සාධක හා බාධක වලින් සමන්විත වි තිබීම මෙන්ම සොබා දහමේ අතවර වලට ලක්වීමේ ප්‍රවණතාවයට විවෘත තත්ත්වයෙන් ම මුහුණ දීමට සිදු වී තිබීම ඉහත තත්ත්වය ඇති වීමට බලපෑ මූලික හේතුන් වී තිබේ.

මීට අමතරව ණය දෙන සමිති ග්‍රාමීය ජනතාවගේ ණය අවශ්‍යතා සපුරාලීමට එද මෙන්ම අදත් කැප වී සිටිති. එද පැවැති එම සමිති වලට නව මුහුණුවරක් දෙමින් "සණස" නමින් එය දැන් ප්‍රචලිතවී තිබේ. මෙම සමිති සමාගම් වලින් එහි සාමාජිකයින්ටත් ණය අවශ්‍යතා සපුරාලනු ලැබේ. "විවෘත ආර්ථිකය" යන සංකල්පය යටතේ සමාජ අවශ්‍යතා වල ද යම් යම් වෙනස්කම් සිදු වෙමින් පවතී. එද අත්‍යවශ්‍ය නොවුනු යම් යම් භාණ්ඩ අද අත්‍යවශය ගණයට ඇතුළත් වී තිබේ. එද සුඛෝපභෝගී ලෙස සැලකූ භාණ්ඩ අද අත්‍යවශ්‍ය වී තිබේ. මෙවැනි සමාජ වෙනස්කම් රාශියක් ඇති වෙමින් පවතින නිසා ඊට අනුකූලව මිනිසුන්ගේ එදිනෙද අවශ්‍යතා ද වෙනස් වෙමින් පවතී. මේ නිසා මූල්‍ය ණය ඉල්ලුම් වල ද පරිනාමික වෙනස්කම් ඇති වී තිබේ. උද. එද රූපවාහිණියක් මිළට ගැනීම සුඛෝපභෝගී ඉල්ලුමක් වුවත් අද අවශ්‍යම අවශ්‍යතාවයක් බවට පත්වී තිබේ. මේ ආකාරයේ වෙනස් වන සමාජ වටිනාකම් සාරධර්ම හා මානව අවශ්‍යතා ඉදිරියේ තම මූලික අවශ්‍යතා සපුරා ගැනීමට මෙන්ම සාපේක්ෂව මූලික නොවන අවශ්‍යතා සපුරා ගැනීමට ද ණය ඉල්ලුම් කිරීමක් දක්නට ලැබේ. දැන් වන්දනා ගමන් යාම, විනෝද ගමන් යාම, නවතම විදුලි උපකරණ වැනි සුඛෝපභෝගී භාන්ඩ සහ සේවා මිළට ගැනීම සඳහා ණය ඉල්ලුම් කිරීමේ ප්‍රවණතාවයක් ඇතිවී තිබේ. ණය දෙන සමිති වල වගකීම හා කැපවීම යොමු වී තිබෙන්නේ සාමාජිකයන්ගේ ණය අවශ්‍යතා සපුරාලීම කෙරෙහි ය. ණය ලබා නුදුන්නොත් ඔවුන් එමගින් ඉටු කරන්නට බලාපොරොත්තු වූ අනාගත අරමුණු අහෝසි වී යයි. මිනිසුන් දුප්පත් වුවත් ඔවුනටත් අනාගත අපේක්ෂාවල් සාර්ථක ලෙස සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාවය තිබේ. එම අපේක්ෂාව ණය ඉල්ලුම් කිරීම සඳහා ඔවුන් පොළඹවනු ලබයි.

මෙම ණය දෙන සමිති වලින් ණය ලබා ගැනීම සඳහා එහි සාමාජිකයින්ට සම්පූර්ණ අයිතිය මෙන්ම ප්‍රවේශ වීමේ හැකියාව ද තිබේ. ණය මුදල් කරා ප්‍රවේශවීම ඉතාමත් අප්‍රමාදව අපහසුකම්වලින් තොරවකළ හැකි බැවින් හා එහි ඇත්තේ සහනදායී පොළී අනුපාතිකයක් ද බැවින් එය ගැමි ජනතාවට අවශ්‍ය ණය ලබා දීමේ ඉතා පහසුතම මූලය වී තිබේ. එමෙන්ම දීර්ඝ කාලයක් තිස්සේ පැවැති සමාජ සම්බන්ධතා නිසා හා එකිනෙකා දැන හැඳින ගෙන තිබීමෙන් ලැබී තිබෙන අන්‍යෝන්‍ය අවබෝධය නිසා අන්‍යෝන්‍ය විශ්වාසයක් ගොඩ නැංවෙන අතර, එය "ණයදීම හා ගැනීම" යන ගනුදෙනුවේ ගතිකත්වය සමග දැඩි සහසම්බන්ධතාවයක් වර්ධනය කරයි. මෙම අන්‍යෝන්‍ය විශ්වාසය සහ අවංකභාවය පිළිබඳ : "සුරැකුම් සහතිකය" නැවතත් ඔවුනට ණය ලබා දීමේ මෙන්ම ණය "කොන්දේසි" ලිහිල් කිරීමේ ප්‍රවණතාවය කෙරෙහි උනන්දුව ඇති කරවයි.

එමෙන්ම ආත්ම ගරුත්වය හා ස්වාධීනතාවය ආරක්ෂා වන අයුරු තම ආර්ථික සාමාජික කටයුතු පවත්වා ගෙන යාමට හා නංවාලීමට මෙවැනි ණය දෙන සමිතිවලට හැකියාව තිබේ. මෙම සමිති වල ණය සැපයීමේ කාර්යය තුළින් ණය කරුවාගේ මුළු ආත්මයම එයට බිලි නොගනී. සමිතිය ඔහුගේ ආත්මය උසස් කර දෙයි. මේ අයුරු එහි සේවය ඉතා ප්‍රශංසනීය එකකි.

අධි පොලියට ණය ගැනීමෙන් හා ණය ගැති භාවයේ දුෂ්ඨ චක්‍රයට හසුවීමෙන් ගැමි ජනතාව මුදා ගැනීම සඳහා යොමු වූ විසඳුම් සමග එකඟ වන සහනදායි පොළී අනුපාතය යටතේ ණය මුදල් ලබා ගෙන තම කටයුතු අඩු වියදමකින් සාර්ථක කර ගැනීමේ හැකියාව ගැමියාට සණස තුළින් ලබා දෙයි.

විවෘත වෙළඳ පොළ පොළියට වඩා අඩුවෙන් පොලිය අයකරන ආයතනික ණය පහසුකම් වල දී එම තත්ත්වය විශේෂයෙන් තම වාසියට යොමු කර ගෙන එය නොනිසි ලෙස භාවිතා කිරීමෙන් අනියම් හා අයුතු ලෙස එම ප්‍රතිලාභ භුක්ති විඳින්නන් බිහිවීම අඩු පොළී ණය යෝජනා ක්‍රම වල අනියම් ප්‍රතිඵලයකි. එවැනි තත්ත්වයක් දිගටම පැවතුණොත් එම ණය යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබෙන්නේ ඉලක්ක ගත අයට නොව පිට අයටය. මේ තත්ත්වය වළක්වා ගැනීම ඊට අදාළව කටයුතු කරන්නන්ගේ අවංක භාවය මත තීරණය වේ. එමෙන් ම එය එහි පැවැත්ම කෙරෙහි අතිශයින්ම අවශ්‍ය කරන ගුණාංගයකි.

රාජ්‍ය වාණිජ බැංකු වලින් ආයතනික ණය පහසුකම් ඇති කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලැබීමේ ප්‍රවණතාවයට වඩා වැඩි වේගයෙන් අනපේක්ෂිත ප්‍රතිඵල උදාකර දී තිබේ. එවැනි තත්ත්වයක් උදා වූ විට දී එය දිගටම පවත්වා ගෙන යාම ගැටළුකාරී එකක් බවට පත්වී තිබේ.

මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන්නේ කළමනාකරණමය දුෂ්කරතා සහ අවංක හා කැප වීමෙන් යුතුව කටයුතු කිරීමට සූදනම් වූ සේවක පිරිස් වල හිඟ කමයි. මීට අමතරව තවත් කරුණු හා විවිධ ආකල්ප අඩු පොලී ණය පහසුකම් වල වටිනාකම බාල කරවීම කෙරෙහි බලපා තිබේ.

* රජයේ අනුග්‍රය යටතේ ලැබෙන නිසා එය ණයකට වඩා දීමනාවක් වශයෙන් සැළකීමට ණය ලාභීන් පෞද්ගලිකව පුරුදු වී සිටීම. (දේශපාලනමය වූ

විවිධ අ පේක්ෂා ඉටුකර ගැනීම සඳහා උපායක් වශයෙන් අඩු පොළී ණය නොසළකා හැරීමේ පුරුද්ද භාවිතයට එක් කිරීම)

* සහනදායී පොළී අනුපාතයකට ණය ලබා දෙන නමුත් එම අරමුදල් නියමිත ණය ලාභීන් වෙත ළඟාකර දීම භාරව සිටින බැංකු වලට ඒ ණය ලාභීන් වෙත සැපයීමේ සේවා හා ලිපි ලේඛණමය වියදම් අධික වීම නිසා එම ගනුදෙනු කරුවන් හැකි තරම් දුරට අඩුකර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වීම හා ඒවා නැවත අය කර ගැනීම කෙරෙහි දැඩි අවධානයක් යොමු නොකිරීම. එමෙන්ම ණය ලාභියා සහ ණය හිමියා අතර පවත්නා සමාජ සම්බන්ධතාවය ගණුදෙනුව කළ පසු අවසන් වී යන සුළු වූවක් බැවින් එහි නොගිලිහෙන සබඳ කමක් නැති නිසා ණය ලාභියා ද ණය ආපසු ගෙවීම කෙරෙහි ධනාත්මක උනන්දුවක් නොදැක්වීම..

* ණය දෙන ආයතන (කරදරකාරී) සුළු පරිමාණ ණය දීම් රාශියක් පවත්වා ගෙන යාමට වඩා මහා පරිමාණ ණය දීම් කිහිපයක් පවත්වා ගෙන යාමට වැඩි කැමැත්තක් දැක්වීම.

* ප්‍රතිමූල්‍ය කරණය යටතේ රජයේ අනුග්‍රහය ඇතිව ලැබෙන ණයක් නිසා පසු කාලයේ දී එය නොසළකා හැරීමේ සැගැවුණු හැකියාවක් ඇතැයි ණයලාභීන් උප කල්පනය කිරීම.

* ග්‍රාමීය අංශයේ ණයලාභීන්ගේ අඩු ඉතිරි කිරීම් ප්‍රතිශතය (ග්‍රාමීය අංශයේ මේ සහනදායි ණය ලාභීන් බොහෝ සෙයින්, ආදායම් ස්තර වල පහළ වටිනාකම් දරණ පරාසයේ සිටින්නෝ ය) ණය නැවත ගෙවා නිම කිරීමට තරම් ප්‍රමාණවත් නොවීම හෙවත් ඔවුන් දුප්පත් කමේ දුෂ්ඨ චක්‍රයට හසුවී සිටීම.

මෙවැනි දුෂ්කරතා වලට මුහුණ දීමෙන් ලද අත්දැකීම් වල ප්‍රතිඵලයක් වශයෙන් හා පවත්නා ප්‍රශ්නවලට යම් විසඳුමක් වශයෙන් 1992 මුල් භාගයේ දී පමණ "ප්‍රජා ණය නියාමක ක්‍රමය" හඳුන්වා දී විස්තීර්ණ ලෙස ප්‍රයෝගිකකරණය කරන ලදී. මහජන බැංකුව ප්‍රජා ණය නියාමකට අරමුදල් සැපයීම කරගෙන යයි.

ඒ ඒ ග්‍රාමීය ප්‍රදේශ වලින් ඉල්ලුම්පත් කැඳවා තෝරා ගන්නා ගමේ වග කිවයුතු එමෙන් ම සමාජයීය වශයෙන් හැමෝම වාගේ පිළිගැනීමක් තිබෙන පුද්ගලයෙකු මේ කාර්යය සඳහා තෝරා ගත ලැබේ. බැංකුවෙන් අරමුදල් මුද හරින්නේ ඔහු වෙතට යි. ග්‍රාමීය ජනතාව ඔහු වෙතින් මුදල් ලබා ගත යුතු යි.

ප්‍රජා ණය නියාමක යනු ද අපේම සමාජයේම කෙනෙකු වන අතර ඔහුගේ කාර්යභාරය පෞද්ගලික ණය හිමියන්ගේ කාර්ය හා සමාන ස්වරූපයක් ගනී. නමුත් වෙනසකට ඇත්තේ ඔහු බැංකුව සමග වගකීමකට බැඳී තිබීමය. ගැමියන්ට ණය සැපයීම හා ආපසු අයකර ගැනීම සම්බන්ධව සැහෙන වෙහෙසක් දැරීමට ඔහුට සිදු වේ. ඔහු තමා කැප කරන කාලයට, දැණුමට, ශ්‍රමයට හා තම මහන්සියට තාර්තික මිනිහෙකු වශයෙන් යම් ලැබීමක් අපේක්ෂා කරන අතර එම ලැබීම උපරිම කර ගැනීමටත් ඒ සඳහා යන පිරිවැය අඩුකර ගැනීමටත් උත්සාහ කරයි. එහිදී පොදුවේ ජනතාවගේ සුභසාධනය වෙත තම සිත යොමු කරන්නට පෙර තමාගේම සුභ සිද්ධිය කෙරෙහි ඔහුගේ සැළකිල්ල යොමු කර ගැනීමට සිදුවේ. යථා ස්වභාවය එයයි. එබැවින් "ප්‍රජා ණය නියාමක" වුවත් අඩු පිරිවැයක් හා වැඩි පිරිවැටුමක් ඇති අංශ වලට තමා අත පත් වන මුදල් ගලා යාමට සැලැස්වීම නොවැළැක්විය හැකි දෙයකි. ඔහු ඉතා අඩු ආර්ථික වටිනාකම් ලබන, අඩු ලාභ ලබන අයගේ ව්‍යාපෘති නංවාලීමට උනන්දු නොවන්නට පුළුවන. ඔහුත් තම අත ඇති මුදල් වලින් වැඩි ආදායමක් උපයන්නට වඩාත් කැමතියි. මුදල් ණයට දීමෙන් ඔහුද අවදානමකට මුහුණ දෙන අතර, කලට වේලාවට අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් ද වේ. මේ නිසා ඔහු මුදල් ආයෝජනය කරන්නේ ද වැඩි ලාභ ලබන ව්‍යාපෘති වලට මිස වැඩි අවදානමක් ඇති එහෙත් අඩු ලාභ ලබන ඒවාට නොවේ. තමා අත පත් මුදල් ප්‍රවේශම් කර ගනිමින් අභිප්‍රේරණ මූලිකව යහපත් ක්‍රියාශීලී සංනිවේදන හැකියාවක් තුළින් තම ව්‍යාපාරය පවත්වා ගත යුතු වන අතර එයට අමතර වශයෙන් ඔහුට දැරීමට සිදුවන සමාජ පිරිවැයක් ද වේ. එම නිසා සමාජ සේවයක් වශයෙන් එම ප්‍රතිපත්ති මත මෙම කාර්යභාරය ඉටු කළොත් විනා ආර්ථිකමය කාර්ය භාරයක් වශයෙන් ඔහුට එය වාසි දයක නොවන්නට ද හොඳටම ඉඩ තිබේ. ඔහු ගන්නා උත්සාහයට සරිලන ඉපැයීමක් එයින් නොලැබේ නම් තාර්තික මිනිසෙකු වශයෙන් ඔහු එම කාර්යයෙහි රැඳී සිටීම නොකරයි. ඔහු එයින් ඉවත්ව යයි.

මේ අනුව "ප්‍රජා ණය නියාමක ක්‍රමය" පිළිබඳ "සුබ සිහිනය" ඇතැම් විට මේ ආර්ථික හා සමාජ වාතාවරණය තුළ අශුභ සිහිනයක් වීමේ විභවතාවයක් ඇති බව තාර්තිකව කරුණු සළකා බලන විට පෙනී යයි.

ගැමි ජනතාවට අවශ්‍ය සුළු ප්‍රාග්ධනය සැපයීම මෙන්ම ඔවුන්ගේ එදිනෙද මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම මේ මගින් සිදු වේ. දුප්පතුන්ට තම වත්කම් පිළිබඳ නිම් වලලු පුළුල් කිරීමට මෙය අතිශයින්ම අවශ්‍ය කරන මූලික අවශ්‍යතාවයකි. එමගින් ඔවුන්ගේ කටයුතු වල ආර්ථික ඵලදායීතාවය වැඩි වීම සිදු වන අතර ඔවුන්ගේ නිෂ්පාදන නිම් වළලු පුළුල් කිරීම රටේ ආර්ථික වර්ධනයට දායක වෙයි.

ගැමි ජනතාවගේ දියුණුවේ මග අහුරා වසා ගෙන සිටින දුප්පත් කම් ඉවත් කරලීමට ග්‍රාමීය ණය පහසුකම් සහනදායි ක්‍රමයකට ලබා දීම තුළින් ඉමහත් සේවයක් සිදු වේ. තමන් සතු නිෂ්පාදන සම්පත් වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක ස්වරූපය වෙනස් කිරීමට හා එමගින් ඒවා වැඩි දියුණු කර ගැනීමට ඔවුන්ට ණය පහසුකම් වලින් ලැබෙන පිටිවහල සුළු පටු එකක් නොවේ.

මහජන සහභාගීත්වය සහ එහි යථාර්ථය



සාකච්ඡා මගින් ප්‍රශ්න විසඳා ගැනීම